**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - 2021**

----------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරික්ෂා කිරිමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු. 464,077,703 ක් වූ වත්කම් වර්ග 05 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂය තුළදී අදාළ කාර්යය නිමකර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව වාර්ෂික ගිණුම් වල එම වටිනාකම් ඇතුළත්කර 2022 ගිණුම් වාර්තා ඉදිරිපත් කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 සිට 2020 දක්වා කාලය තුළ කිලිනොච්චි ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය හා ජාතික ආධුනිකත්ව පුහුණු කිරීමේ අධිකාරිය අතර සිදුවූ ගනුදෙනු සඳහා පවත්වාගෙන ගිය රු. 129,168,821 ක් වූ ජංගම ගිණුමේ ශේෂය, කිලිනොච්චි ආයතනය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට පවරා ගැනීමෙන් පසුව ගිණුම් ශේෂයන් ගලපා සැසඳීමට කටයුතු නොකර එම ශේෂය ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි. | කිලිනොච්චි ලංකා ජර්මන් අභ්‍යාස ආයතනය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස කටුබැද්ද ආයතනය වෙත පැවරීමේ ක්‍රියාවලියට සම්බන්ධව ඇතැම් කටයුතු තවදුරටත් අවසන් වී නොමැති බැවින් එම කාර්යයන් අවසන් වූ වහාම අදාළ පාලන ගිණුම් ශේෂය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ සංසන්දනය කර මෙම ගිණුම් ශේෂය නිසි අනුමැතිය සහිතව කපා හැරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | ගිණුම් ශේෂයන් සසඳා ගැලපීමට කටයුතු කළ යුතුය. |

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ 10 කට වඩා පැරණි එකතුව රු. 1,407,197 ක් වූ ණයගැති ශේෂයන් සහ වර්ෂ 05 ත් 10 ත් අතර එකතුව රු. 932,436 ක් වූ ශේෂයන් අයකර ගැනීමට හෝ මුදල් | ලැබිය යුතු ණයගැතියන්ගෙන් විශාල ප්‍රමාණයක් ශ්‍රී.ලං.ග.ම. බස්රථ අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් අය විය යුතු මුදල් බව දන්වා සිටිමි. | ණය ගැති ශේෂ අයකර ගැනීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| රෙගුලාසි 113 ප්‍රකාරව අනුමැතිය ලබාගෙන පොත් වලින් කපාහැරීම සඳහා හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | දීර්ඝකාලීනව අයකරගත නොහැකි ශේෂයන් අදාල අනුමැතිය සහිතව පොත්වලින් කපාහැරීමට කඩිනමින් කටයුතු කරන බව දන්වා සිටිමි. |

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම
---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 13.3 ඡේදය. | වැඩබැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරනතෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. තනතුරට පූර්ණ කාලීන නිලධාරියකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීමක් නොපමාව කළ යුතු වුවත්, ආයතනයේ අධ්‍යක්ෂ විදුහල්පති තනතුර සඳහා ස්ථිර පදනමින් නිලධාරියකු පත්කර ගැනීම සඳහා ආයතනය ප්‍රමාණවත් පියවර නොගෙන පාලක මණ්ඩල සාමාජිකයකු 2020 පෙබරවාරි 18 දින සිට පත්කර තිබුණි. | අධ්‍යක්ෂ-විදුහල්පති තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම සිදු කිරීම සඳහා අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය ඉල්ලා ලිපියක් යවා ඇත. මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් අනුව බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයතනයේ නිලධාරීන්ට කිසිදු දීමනාවක් නොගෙවිය යුතු බව පැහැදිලිව දක්වා තිබියදී 2021 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අන්තර්ජාලය මඟින් දේශන පැවැත්වීම වෙනුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මාසිකව රු. 2000 බැගින් 2021 වර්ෂයේ එකතුව රු. 1,634,000 ක් ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයන් තම පෞද්ගලික වියදමින් අන්තර්ජාලය භාවිතයෙන් දේශන සකස්කිරීම සහ පැවැත්වීම සඳහා ආයතනීය අනුග්‍රහයක් ලෙස ලබාදුන් රු.2,000 එක් එක් අංශවල අංශ ප්‍රධානීන් විසින් කරන ලද ඉල්ලීම් සියල්ල එක් පත්‍රිකාවකට ගොනුකර විදුහල්පති අනුමැතියෙන් ගෙවීම් කටයුතු සඳහා යොමු කළ යුතු බව දැනුම් දෙමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජූලි 17 දිනැති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38 1 (ඇ) ඡේදය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙළ කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්තිත්වයන්ට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වග බලාගත යුතු වුවත්, 2018 හා 2019 වර්ෂවල වාර්ෂික වාර්තා මෙතෙක් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2018 සහ 2019 වාර්ෂික වාර්තා හැකි ඉක්මනින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 24,918,761 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 22,943,923 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 8.6 කින් හෙවත් රු. 1,974,838 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වාර්ෂික ක්ෂය රු. 62,986,097 කින් වැඩිවීම හා ගිවිසුම්ගත සේවා වියදම රු. 7,323,542 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 හඳුනා ගත් පාඩු

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ වාහන අළුත්වැඩියා අංශයේ වැඩ බිම සැකසීම සඳහා ආයතනයේ ඉංජිනේරු විසින් පිළියෙළ කළ ඇස්තමේන්තුව ඉක්මවා රු. 1,218,922 ක් පෞද්ගලික ආයතනයට ගෙවීම් කර තිබුණු අතර, එම කොන්ත්‍රාත්තුවට අදාල අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය ප්‍රතික්ෂේප කිරීමට හේතුවූ සාධක තහවුරු කර ගැනීමට අදාල ලිපි ලේඛන ලිපිගොනුව තුළ අන්තර්ගත නොකර දෙවන අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබීම හේතුවෙන් ආයතනයට රු. 1,196,022 ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | මෙම කාර්යය සම්බන්ධව ඉංජිනේරු ඇස්තමේන්තුව රු. 8,363,600.00 (බදු රහිත) වන අතර, ගෙවීම් සඳහා නිර්දේශිත මුදල රු. 9,163,000.25 බව දන්වමි.<br><br>ඒ අනුව, සමස්ථ මිල වෙනස රු. 799,400.25 කි. තවද, මිල විචලනය 9.56% ක් වන අතර, එය සුළු විචලනයක් බව දන්වා සිටිමි. | ආයතනයට සිදුවූ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු අදාළ කාර්යය සඳහා නොගැළපෙන අමුද්‍රව්‍යයන් ලංසු ලේඛනයේ ඉදිරිපත් කර තිබීම යන කරුණ මත එකී ලංසුව තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පසුගිය වසර 05 ක කාලය තුළ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඉල්ලුම වාර්ෂිකව ඉහළ ගියද, වැඩිවන ඉල්ලුමට සාපේක්ෂව පාඨමාලා සඳහා බඳවා ගැනීම් ඉහළ දැමීමට 2016 වසරේ සිට 2021 වසර සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. පූර්ණ කාලීන පාඨමාලා සඳහා බඳවා ගැනීමේ පරීක්ෂණයට සිසුන් විශාල පිරිසක් සහභාගීවුවද, ඉන් බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 20 ටත් අඩු මට්ටමක පවතින අතර බඳවාගත් සිසුන් සංඛ්‍යාව වසර 05 ක් තිස්සේ 600 ක් වැනි ස්ථාවර අගයක පැවතුණි. එමෙන්ම කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේ සිට සිසුන් බඳවා ගැනීම් 270 ක් පමණ වන බවත්, මේ වන විට මධ්‍යස්ථානය ආරම්භ කර වර්ෂ 05 ක් පමණ ගතවී ඇතත් ශිෂ්‍ය බඳවා ගැනීමේ සීමා වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පසුගිය වර්ෂ 05 ක කාලය තුළ මොරටුව ශාඛාවේ පූර්ණකාලීන පාඨමාලා ඉල්ලුම ඉහළ ගිය නමුත් දැනට ඇති භෞතික සම්පත් හා ඉඩ පහසුකම් වර්ෂයකට සිසුන් 600 කට පමණක් ප්‍රමාණවත් වන අතර එයට විකල්පයක් ලෙස බොරැල්ල කලාපීය මධ්‍යස්ථානය සහ ආනමඩුව කලාපීය මධ්‍යස්ථානය පිහිටුවා අතිරික්ත ඉල්ලුම්කරුවන් හට අවස්ථාව ලබාදීමට කටයුතු කරන ලදී.<br>ඊට අමතරව පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා සහභාගී කරගැනීමට නොහැකි වූ දරුවන් සඳහා අර්ධකාලීන පාඨමාලාවලට සහභාගී වීමට අවස්ථාව සැලසීම හා තෝරාගැනීමේ දී ප්‍රමුඛත්වයක් ලබාදෙන ලදී. ඒ අනුව වසරකට සිසුන් 4000 ක් පමණ පුහුණුව ලබයි. | ආයතනයේ ධාරිතාව වැඩිකර ගැනීම සඳහා නිසි සැලැස්මකින් යුතුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 4 (ඌ) වගන්තිය අනුව කලාපීය පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා 2021 අප්‍රේල් 06 දින පැවති පාලක මණ්ඩල රැස්වීම් තීරණ අනුව මඩකලපුව ප්‍රදේශයේ කලාපීය පුහුණු මධ්‍යස්ථානයක් ඇරඹීම සඳහා සාකච්ඡා කර තිබුණද, මේ සම්බන්ධව කිසිඳු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි. 2021 වර්ෂයේ අළුතෙන් ආරම්භ කර තිබූ ආණමඩුව පුහුණු මධ්‍යස්ථානයේද එක් පාඨමාලාවක් පමණක් ආරම්භ කර ඇති අතර එහි ශිෂ්‍ය සහභාගීත්ව සංඛ්‍යාව 67 ක් බව නිරීක්ෂණය විය. | 2017 අංක 15 දරණ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනතේ 4 (ඌ) වගන්තිය අනුව කලාපීය මධ්‍යස්ථාන දෙකක් මේ වන විට ආරම්භ කර ඇති අතර මොණරාගල ප්‍රදේශයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ කලාපීය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා මේ වන විට සැලසුම් සකස් කරමින් පවතී. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2016 වර්ෂයේ බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා 02 ක් සහ පදනම් පාඨමාලාවක් සඳහා සිසුන් 147 දෙනෙකු පුහුණුව ලබමින් සිටි නමුත් වර්තමානය වන විට එක් පාඨමාලාවක් වන ත්‍රී රෝද රථ කාර්මික ශිල්පී පාඨමාලාවක් පමණක් පවත්වාගෙන යනු ලබන අතර ශිෂ්‍ය සංඛ්‍යාවද 44 ක් වැනි අඩු අගයක්ව පැවතුණි. | වසර 03 ක පමණ කාලයක් වසා දමා තිබූ බොරැල්ල පුහුණු මධ්‍යස්ථානය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ බොරැල්ල කලාපීය මධ්‍යස්ථානය ලෙස 2021 වසරේ අළුත්වැඩියා කිරීමෙන් පසු ත්‍රී රෝද රථ කාර්මික ශිල්පී පාඨමාලාව ආරම්භ කරන ලදී. මෙ වන විට කණ්ඩායම් දෙකක් බඳවා ගෙන ඇති අතර 2022 වසරේ බොරැල්ල කලාපීය මධ්‍යස්ථානයට බඳවාගැනීම පුළුල් කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතී. | ආයතනයේ ධාරිතාවය වැඩිකර ගැනීම සඳහා නිසි සැලැස්මකින් යුතුව කටයුතු කළ යුතුය. |
| (ඈ) ආයතනය සතු අධ්‍යක්ෂ/විදුහල්පති නිල නිවසේ ආයතනයේ නිලධාරියකු නොවන කර්මාන්ත අමාත්‍යාංශයට අයත් අතිරේක ලේකම්වරයකු 2019 දෙසැම්බර් 27 දින තෙක් පදිංචිව සිටි අතර එදින සිට මේ දක්වා මෙම නිල නිවසේ කිසිඳු නිලධාරියකු භාවිතයට ගෙන නොතිබුණි. 2020 හා 2021 වර්ෂයේදී නිල නිවසේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් එකතුව රු. 1,428,610 ක් ප්‍රයෝජනයට නොගන්නා නිල නිවස වෙනුවෙන් ආයතනය විසින් ගෙවීම් සිදුකර තිබුණි. | ස්ථිර පදනමින් අධ්‍යක්ෂ - විදුහල්පතිවරයකු ආයතනයේ නොසිටීම හේතුවෙන් මෙම නිල නිවස භාවිතයට නොගන්නා ලදී.<br><br>නිලධාරියකු වාසය නොකලද ආයතනය සතු දේපලක් වන මෙහි ආරක්ෂාව සඳහා කටයුතු කල යුතු බැවින්, පුද්ගලික ආරක්ෂක නිලධාරියකු යෙදවීමට සිදු වූ අතර ඒ වෙනුවෙන් අදාල ආරක්ෂක ආයතනයට මුදල් ගෙවීමට සිදු වුනි. | නිල නිවසේ ආරක්ෂාව තහවුරු වන පරිදි සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඉ) ආයතනය විසින් භුක්ති විඳිනු ලබන එකතුව අක්කර 29 ක් හා හෙක්ටයාර් 0.35029 ක් වූ ඉඩම් 05 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීම සඳහා ආයතනය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | දීර්ඝ කාලයක සිට ආයතනය භුක්ති විඳගෙන එනු ලබන ඉඩම් වල සහ ගොඩනැගිලි වල අයිතිය විධිමත් පරිදි ආයතනය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ඉල්ලීමක් අමාත්‍යාංශ ලේකම් වෙත 2019.05.09 දින යොමු කර ඇති අතර ,ඒ අනුව ඉඩම්වල අයිතිය පවරා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා අමාත්‍යාංශ ලේකම් විසින් ඉඩම් කොමසාරිස් වෙත ලිපියක් යොමු කර ඇත.<br><br>මෙම ඉඩම ආයතනය වෙත පවරා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින බව දන්වමි. | ආයතනය සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අවසාන විභාගයට පෙනී සිට සමත් වූ සහතික පත්‍ර ලබාදී නොතිබුණු සිසුන් සංඛ්‍යාව සියයට 27 සිට සියයට 61 දක්වා ඉහළ ප්‍රතිශතයක් වී තිබුණු අතර අදාල සිසුන් හට සහතික පත්‍ර ලබාදීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් කළමනාකරණය විසින් සකස් කර නොතිබුණි. | 2017 සිට 2020 වර්ෂය දක්වා පූර්ණ කාලීන පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කළ සිසුන් අවසාන වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටීමෙන් පසුව ඔවුන් හට විභාග ප්‍රතිඵල නිකුත් වීමෙන් පසු විභාගය සමත් සියලුම සිසුන් සඳහා තාවකාලික සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ. එම සහතික පත්‍රය භාවිතා කරමින් සිසුන් වැඩි ප්‍රමාණයක් දේශීය රැකියා සඳහා මෙන්ම විදේශීය රැකියා සඳහා යොමු වෙයි. ඔවුන්ගේ අදාල නියමිත සහතික පත්‍ර අවශ්‍ය වූ විට ආයතනයට පැමිණ සහතික පත්‍රය රැගෙන යනු ලැබේ. එම සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා කිසිදු ගාස්තුවක් අය නොකරයි. | සහතික පත්‍ර ප්‍රදානය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. |
| (උ) පුරප්පාඩු වී ඇති ප්‍රධාන තනතුරු පහට අදාළව අධ්‍යාපන සුදුසුකම් වලට සම වැටුප්තල සකස් කර ඒ පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමට හා ආයතනයේ සේවක තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී වැටුප් වර්ධක සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සහගත තත්ත්වයන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට 2019 මැයි 23 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ එම තීරණයන් 2021 දෙසැම්බර් 31 දින තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ආයතනයේ ක්‍රියාත්මක සියළු වෘත්තීය සමිති හා ඉහල කළමනාකාරිත්ව නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් මඟින් ජාතික වැටුප් කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පැවැති සාකච්ඡා වලදී ලද උපදෙස් හා දැනුවත් කිරීම් වලට අනුව සේවක ජ්‍යෙෂ්ඨත්වයට බලපෑම් නොවන පරිදි උපයා ගෙන ඇති වැටුප් වර්ධක අනුව අන්තර්ග්‍රණය සිදු කරන ලදී . | බඳවා ගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර, තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් නිවැරදි කරගත යුතුය. |

3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්
------------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------------------ | -------------------------------- | ------------------ |
| (අ) | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඇස්තමේන්තු කර අනුමැතිය ලබාගෙන තිබූ එකතු වටිනාකම රු. මිලියන 47.2 ක් වූ ක්‍රියාකාරකම් 12 ක් වැඩ ආරම්භ නොකර නවතා දමා තිබුණු අතර, රු. මිලියන 12 ක් ඇස්තමේන්තු කර තිබූ ක්‍රියාකාරකම් 02 ක් සඳහා වැයකර තිබූ මුදල රු.මිලියන 1.831 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 20 ට වඩා අඩු මට්ටමක පැවතුණි. | සමාලෝචිත කාල පරිච්ඡේදයේ අනපේක්ෂිත ලෙස ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය හේතුකොට ගෙන ආයතනය වසා තැබීම ආරම්භ කළද සේවකයින් සිටින සංඛ්‍යාව සේවයට කැඳවීම මෙන්ම රජය විසින් ප්‍රසම්පාදන කාර්යයන් වහාම අත්හිටුවන ලෙස නිකුත් කරන ලද චක්‍රලේක ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවීම වැනි ආයතනීය කළමණාකාරිත්වයේ පාලනයට පරිභාහිරව සිදු වූ කරුණු මත අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව කාරුණිකව දන්වමි. | අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති අරඹම කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ආංශික නිපුණතා සංවර්ධන අරමුදල මගින් 2018 වර්ෂයේ ආරම්භ කර 2020 ඔක්තෝබර් 25 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශිෂ්‍යයන් සඳහා ඉදිකරන ලද මහල් 06 කින් යුත් අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 75 ක් හා වැය කර තිබූ මුළු මුදල රු.මිලියන 559.7 ක් විය. | ආධුනික නේවාසිකාගාරය ඉදිකිරීමේ කටයුතු රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් ඉටු කරනු ලබන අතර වැඩ අවසන් වීමෙන් අනතුරුව ආයතනය වෙත භාර දීමට නියමිතව ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුවන අකාරයෙන් ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කළ යුතුය. |